පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ :- 15/2025

මගේ අංකය : NCP/PSC/3/1/5 (2025)
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත,
අනුරාධපුර.
2025.05.

උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාරවර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2026

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2022.10.17 දින අනුමත කරන ලද උතුරු මැද පළාතේ ඒකාබද්ධ සේවයට අදාළ නව වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි. (උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.nc.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය)

02. ඒ අනුව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2026 වර්ෂයේ පෙබරවාරි මස 01 දින සිට පහත සඳහන් සේවාවන්වලට අදාල නිලධාරීන්ට/සේවකයින්ට වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේ ස්ථාන මාරුවීම් ලබා දීමට තීරණය කර ඇත.

I. උ.මැ.ප රාජ්‍ය සේවයේ භාෂා පරිවර්තක සේවය
II. උ.මැ.ප රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය
III. උ.මැ.ප රාජ්‍ය සේවයේ සංවර්ධන නිලධාරී සේවය
IV. උ.මැ.ප රාජ්‍ය කළමනාකරණ සේවා නිලධාරි සේවය
V. උ.මැ.ප රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු සේවය
VI. උ.මැ.ප රාජ්‍ය සේවයේ කාර්යාල සේවක සේවය

**03. 2024 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබා දී ඇති, එහෙත් මෙතෙක් ක්‍රියාත්මක නොකරන ලද ස්ථාන මාරු නියෝග වහාම ක්‍රියාත්මක කළ යුතු වේ.**

**04.** මෙම චක්‍රලේඛය නිකුත් කල දින සිට 2026 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් කළ අයදුම්කරුවන්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කර අවසාන වන තෙක් විනය හේතූන් මත හා සේවා අවශ්‍යතාවය මත කෙරෙන ස්ථාන මාරු හැරුණු විට සෙසු සියළුම අභ්‍යන්තර ස්ථාන මාරු ක්‍රියාත්මක නොකල යුතු වන අතර, අදාල ඉල්ලීම්ද මා වෙත යොමු කිරීමෙන් වළකින ලෙස කාරුණිකව දන්වමි.

ඒ අනුව අදාළ ස්ථාන මාරු අපේක්ෂිත කාල වකවානු තුළදී ක්‍රියාත්මක කිරීමට හැකිවන ලෙස පහත අයුරු කටයුතු කරනු ඇතැයි සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් අපේක්ෂා කරනු ලැබේ.

**05. ස්ථාන මාරුවීම් වලදී සැළකිය යුතු පොදු කරුණු**

05.1. මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් ආයතනයේ සියළුම නිලධරයින්/සේවකයින් දැනුවත් කල යුතුය.

05.2. පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන් වන භාෂා පරිවර්තක සේවය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය/ සංවර්ධන නිලධාරි සේවය / කළමනාකරණ සේවා නිලධාරී සේවය / රියදුරු සේවය/කාර්යාල සේවක සේවයේ නිලධාරීන්/සේවකයින් මේ යටතේ ස්ථාන මාරු අයදුම් කළ යුතුය.

05.3. වාර්ෂික ස්ථාන මාරු සඳහා කාලය ගණනය කිරීමේදී ආරම්භක දිනය ලෙස නවක නිලධරයින්/සේවකයින් වර්තමාන සේවා ස්ථානයේ රාජකාරි සඳහා සේවයට වාර්තා කළ වර්ෂයේ ජනවාරි 01 දින සිටද, වෙනත් ආයතනයකින් ස්ථාන මාරු පැමිණි අයෙකු නම් එම ස්ථාන මාරුව ක්‍රියාත්මක වර්ෂයේ ස්ථාන මාරු ක්‍රියාත්මක වූ දින සිටද, 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවා කාලය ගණනය කළ යුතුය.

05.4. (අ) කිසියම් සේවා ස්ථානයක වසර 02ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරීන්/සේවකයින් ස්ථාන මාරුවීම් ඉල්ලා සිටීම සඳහා සුදුසුකම් ලබයි.

(ආ) එකම සේවා ස්ථානයක හෝ උ.මැ.ප වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ ඇ. 01 හි දක්වා ඇති සේවා ස්ථානයක හෝ එකම අමාත්‍යාංශය යටතේ සේවා ස්ථාන කිහිපයක් තුළ වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ඉහත 02 ඡේදයේ සඳහන් සේවාවල සියළුම නිලධාරීන්/සේවකයින් ස්ථාන මාරු අයදුම් කිරීම අනිවාර්යය වේ.

(ඇ) පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 03ක් සම්පූර්ණ කරන ලද 02 ඡේදයේ සඳහන් සේවාවල සියළුම නිලධාරීන්/සේවකයින් ස්ථාන මාරු අයදුම් කිරීම අනිවාර්යය වේ.

05.5. (අ) සේවා කාලය ගණනය කිරීමේදී දෙපාර්තමේන්තුවක හෝ ඒ යටතේ වූ වෙනත් කාර්යාලයක අඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලයක් ලෙස ගණන් ගනු ලැබේ.

(ආ) කිසියම් දෙපාර්තමේන්තුවක් යටතේ කුමන දිස්ත්‍රික්කයක සේවය කළ ද, එම සේවා කාලය එම දෙපාර්තමේන්තුවේ සේවා කාලය වශයෙන් ගණන් ගනු ලැබේ.

05.6. (අ) දෙපාර්තමේන්තුවක සේවය කළ කාලය ගණන් ගැනීමේදී නිලධරයන් පාලන විෂය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ගණන් ගනු නොලැබේ.

(ආ) ස්ථාන මාරු ඉල්ලීමේ දී **ආයතන වශයෙන්** ඉල්ලීම් ඉදිරිපත් නොකල යුතු අතර ***නගර වශයෙන්*** පමණක් ඉල්ලීම් ඉදිරිපත් කල යුතුය.(උදා :- තලාව, තඹුත්තේගම, ගලෙන්බිඳුනුවැව, ලංකාපුර, වැලිකන්ද ආදී වශයෙන්)

ඇ) ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප සේවා ස්ථානයක (උ.මැ.ප වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ ඇ. 01) වසර 05 ක් සේවය කළ නිලධාරියෙකු අනිවාර්යෙන් ස්ථාන මාරු අයදුම් කළ යුතු අතර එම නිලධාරියාට නැවත ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයකට මාරුවීමට ඉල්ලුම් කළ හැක්කේ ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයෙන් පිටතට ගොස් වසර 10ක් ගතවී ඇත්නම් පමණි.

05.7. භාර්යාව හා ස්වාමිපුරුෂයා යන දෙදෙනාම රාජ්‍ය සේවයේ නියුක්ත අය නම් එම දෙදෙනාටම ඔවුන්ගේ ඉල්ලීම අනුව එකම ප්‍රදේශයක සේවය කරන්නට ඉඩ ලබා දීමට මාරු මණ්ඩලය සෑම උත්සාහයක්ම දරනු ඇත.

05.8. නිලධරයාගේ / සේවකයාගේ ඉල්ලීම හෝ අදාල විය හැකි වෙනත් විශේෂිත හේතු මත හැර 2025.12.31 දිනට වයස අවුරුදු 58 ඉක්ම වූ නිලධාරීන් ස්ථාන මාරුවීම්වලට යටත් නොවන්නේය.

06. (අ) පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක්තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි ඒ සම්බන්ධයෙන් පිළිගත හැකි කරුණු ඇතිව තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ නිර්දේශ සහිතව අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු අතර ඒවා සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සලකා බලනු ලැබේ.

(ආ) කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ ඒකාබද්ධ සේවයේ සේවයකට අයත් වෘත්තීය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන්ගේ ස්ථාන මාරු අදාළ වෘත්තීය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතු වලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කළ යුතුය.

**ස්ථාන මාරු කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති හා ඒ සම්බන්ධ ක්‍රියාවලිය :-**

07. **අංක 01 ආකෘතිය - (සේවා කාලය වසර 5 කට වැඩි අයදුම්කරුවන්)**

මෙම චක්‍රලේඛයහි 05.4 (ආ) ඡේදයේ සුදුසුකම් ලබන නිලධරයන්/සේවකයින් තමන් ස්ථාන මාරු වීමට කැමති නගර පැහැදිලිව දක්වමින් අමුණා ඇති අංක 01 ආකෘතිය අනුව ඉල්ලුම්පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

07.1 **අංක 02 ආකෘතිය - (අංක 01 ආකෘතියේ ඉල්ලුම්පත්‍ර උපලේඛණය)**

දෙපාර්තමේත්තු ප්‍රධානියා අංක 01 ආකෘතිය යටතේ තමන්ට ලැබෙන අවු. 05 ට වැඩි නිලධරයන්ගේ ඉල්ලුම්පත්‍ර සියල්ල අංක 02 ආකෘතියට අනුකූලව උපලේඛණ ගත කොට 2025.07.30 දිනට පෙර ලැබෙන සේ සිය අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය.

07.2. **අංක 03 ආකෘතිය - (සේවා කාලය වසර 02 ක් සම්පූර්ණ කල හා වසර 05ට අඩු අයදුම්කරුවන්)**

මෙම චක්‍රලේඛයේ 05.4 (අ/ඇ) ඡේදයේ දැක්වෙන නිලධරයන් /සේවකයින් තමන් ස්ථාන මාරුවීමට කැමති නගර පැහැදිලිවම දක්වමින් අංක 03 ආකෘතිය අනුව සකස් කළ ඉල්ලුම්පත්‍රයක් දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

07.3. **අංක 04 ආකෘතිය - (අංක 03 ආකෘතියේ ඉල්ලුම්පත්‍ර උපලේඛණය)**

දෙපාර්තමේන්තු ප්‍රධානියා අංක 03 ආකෘතිය යටතේ තමන්ට ලැබෙන ඉල්ලුම්පත්‍ර සියල්ල අංක 04 ආකෘතියට අනුව උපලේඛණ ගත කොට 2025.07.30 දිනට පෙර ලැබෙන සේ සිය අමාත්‍යාංශ ලේකම් වෙත එවිය යුතුය.

07.4. **අංක 05 ආකෘතිය - (ස්ථාන මාරු අයදුම් නොකල නිලධරයින් / සේවකයින්)**

වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූද, ඉහත 5.8 යටතේ වයස අවුරුදු 58 ඉක්මවූ නිලධාරීන් යටතට නොගැනෙන, අයදුම්පත් ඉදිරිපත් නොකරන ලද අයගේ තොරතුරු අංක 05 ආකෘතිය අනුව සම්පූර්ණ කර එහි නිරවද්‍යතාවය දෙපාර්තමේන්තු ප්‍රධානියා/අමාත්‍යාංශ ලේකම් (අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය) විසින් පෞද්ගලිකව සනාථ කර 2025.08.15 දිනට පෙර මා වෙත එවීමට කටයුතු කල යුතුය.

07.5. උක්ත අංක 07.4 ආකෘතිය මඟින් තොරතුරු ලබා ගෙන ස්ථාන මාරු කරනු ලබන නිලධරයන්/සේවකයින් හට අභියාචනා අවස්ථා හිමි නොවනු ඇත.

07.6. ස්ථාන මාරු නියෝග නිකුත් කල පසු සේවා අවශ්‍යතාවය මත හෝ කුමන හේතුවක් මත නිලධරයින්/සේවකයින් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු කාර්යාල වල රඳවා නොගත යුතුය.

07.7. **අමාත්‍යාංශ ලේකම්ගේ කාර්ය භාරය**

දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ඔබ වෙත ලැබෙන ඉල්ලුම්පත්වල සාරාංශයන් වල (අංක 02 හා අංක 04 ආකෘති) හා අංක 05 ආකෘතියේ ඔබගේ නිර්දේශය සටහන් කිරීමටත්, ඔබ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සියළුම ස්ථාන මාරු ඉල්ලුම්පත්වල/වාර්තාවල ඔබගේ නිර්දේශය සටහන් කිරීමටත්,එම සියළුම ඉල්ලුම්පත්‍ර හා වාර්තා 2025.08.15 දිනට පෙර මා වෙත එවීමටත් කටයුතු කල යුතුය.

**සටහන :-** ආකෘති පත්‍ර සකස් කර එවීමේදී එක් එක් සේවාවන් සඳහා වෙන වෙනම ආකෘති පත්‍ර සකස් කර එවිය යුතුය.

සෑම නිලධාරියකු/සේවකයකු පිළිබඳවම නිවැරදි සම්පූර්ණ තොරතුරු සැපයීමට ආයතන ප්‍රධානීන් වගබලා ගත යුතුය. සාවද්‍ය හා අසම්පූර්ණ තොරතුරු ඉදිරිපත් කර ඇති බවට හෙළිවුවහොත් ඒ පිළිබඳව ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා පරීක්ෂා කළ නිලධාරීන් වගකීමට බැඳී සිටින අතර යම් සාවද්‍ය තොරතුරක් ඉදිරිපත් කර හෝ තොරතුරු හිතාමතා යටපත් කර ඇති බව හෙළිවුවහොත් විනයානුකූලව කටයුතු කිරීමට යටත් වේ.

ස්ථාන මාරු කිරීමේ දී දුෂ්කර සේවා ස්ථානයක සේවය කරන නිලධරයන්/සේවකයින් හට ප්‍රියමනාප සේවා ස්ථානයක් ලබා දීම සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

### විශේෂ උපදෙස් :-

08. ස්ථාන මාරුවීම් ලැබේයැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරී කටයුතු කල් ඇතිව වෙනත් නිලධරයන්ට පුහුණු කර වාර්ෂික ස්ථාන මාරු නියමිත දිනට අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානීන්/අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කරන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

09. අයදුම්පත් නිසිලෙස සම්පූර්ණ නොකිරීම නිසා ස්ථාන මාරු ඉල්ලුම් කරන නිලධරයන්ට/සේවකයින්ට සිදු වන අපහසුතා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සලකා බලනු නොලැබේ.

10. අමාත්‍යාංශයෙන්/දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිලධරයන්/සේවකයින් අනුප්‍රාප්තිකයින් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකිවන සේ මුදා හැරීමට කටයුතු කළ යුතුය. මෙහි දී රාජකාරි භාර දීමට සුදුසු නිලධරයන්/සේවකයින් නොමැතිනම් අංශ ප්‍රධානියා වෙත හෝ රාජකාරි භාර දී අදාල නිලධරයින්/සේවකයින් නිදහස් කල යුතුය. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ආයතන ප්‍රධානීන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අදාළ විනය බලධාරියා වෙත වාර්තා කරනු ලැබේ.

11. ස්ථාන මාරු ලැබූ සියළුම නිලධරයින් / සේවකයින් නියමිත දිනයේදීම නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

### වාර්ෂික ස්ථාන මාරු අභියාචනා කමිටු :-

12. ස්ථාන මාරු යෝජනාවන්ට විරුද්ධව කෙරෙන අභියාචනා සලකා බැලීම වාර්ෂික ස්ථාන මාරු අභියාචනා කමිටු විසින් කටයුතු කරනු ලබයි.

13. එම අභියාචනා කමිටු විසින් අභියාචනා තීරණ ලබා දුන් පසුව, නිලධරයකුගේ/සේවකයෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධාරියාට/සේවකයාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට ආයතන ප්‍රධානියාට/දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ ලේකම්වරයාට හෝ හිමිකමක් නැත.

13.1. අභියාචනා යොමු කිරීමේදී කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ අංක 15 පරිශිෂ්ටය ප්‍රකාරව සකස් කල අභියාචනා පමණක් යොමු කල යුතුය.

13.2. අභියාචනා කමිටුවට ඉදිරිපත් නොවූ, නියමිත ආකෘතියෙන් බැහැරව සහ නියමිත දිනයට පසුව ලැබෙන අභියාචනා පිළිබඳව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සළකා නොබලනු ඇත.

13.3. (අ) ස්ථාන මාරු සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා නියමිත දිනට පෙර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානීන් කටයුතු කල යුතුය.

(ආ) ස්ථාන මාරු අභියාචනා පිටපත් දෙකකින් යුතුව සකස් කර එක් පිටපතක් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් එවිය යුතු අතර එක් පිටපතක් සෘජු පිටපතක් ලෙස නම්කර ඉල්ලුම්කරු විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට සෘජුවම එවිය යුතුය.

## 2026 වාර්ෂික ස්ථාන මාරු කාල සටහන.

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් විසින් නියමිත දිනට පෙර අදාළ ස්ථාන මාරු අයදුම් පත්‍ර හා අකෘති පත්‍ර නිවැරදිව සකස් කර අදාළ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු අතර, පහත කාල සටහන පරිදි එම වාර්තා අමාත්‍යාංශ ලේකම් විසින් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

| | |
|---|---|
| 2025.07.01 | කොමිෂන් සභාව විසින් ස්ථාන මාරු, චක්‍රලේඛය ප්‍රසිද්ධ කිරීම. |
| 2025.07.30 ට පෙර | ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් මෙම දැන්වීම තම කාර්යාලය තුල ප්‍රසිද්ධ කර අදාළ ඉල්ලුම් පත්‍ර හා ආකෘති වාර්තා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීම. |
| 2025.08.15 ට පෙර | දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතින් ලබා ගන්නා හා තම අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ ඉල්ලුම්පත්‍ර හා වාර්තා අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.(අංක 02,04 හා 05 ආකෘති) |
| 2025.09.15 ට පෙර | මාරු මණ්ඩල රැස් වී තීරණ ගෙන අවසන් කිරීම. |
| 2025.09.30 ට පෙර | මාරු මණ්ඩල තීරණ දැනුම් දීම. |
| 2025.10.15 ට පෙර | අභියාචනා ඉදිරිපත් කිරීම / අභියාචනා මණ්ඩල රැස්වී තීරණ ගැනීම. |
| 2025.11.15 ට පෙර | අභියාචනා තීරණ දැනුම් දීම. |
| 2026.02.01 | වාර්ෂික ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම. |

මෙම ස්ථාන මාරු සම්බන්ධ අවසාන තීරණය ගරු ආණ්ඩුකාරතුමාගේ එකඟතාවය ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

- ❖ මෙම චක්‍රලේඛය හා අදාල ආකෘති පත්‍ර උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.nc.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැකිය.

පී.එස්.විමලවීර,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

(වා.ස්.මා.අංක 01

ආකෘතිය)

## උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි
## වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත -2026
(වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් / සේවකයින් සඳහා)

| සේවය:- | තනතුර:- | | ශ්‍රේණිය:- | |
|---|---|---|---|---|
| අධීක්ෂණ තනතුරක් දරන්නේද? | දරණු ලබන අධීක්ෂණ නිලධාරී තනතුර:- | | | |

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| 01. සම්පූර්ණ නම :- | | | |
| 02. මුලකුරු සමඟ නම :- | | | |
| 03. උපන් දිනය :- | 04. වයස (2025.12.31 දිනට) අවු............මාස.........දින....... | 05. ජාතික හැඳුනුම්පත් අංකය :- | 06. ස්ත්‍රී /පුරුෂ භාවය |
| 07. ස්ථිර ලිපිනය :- | 08. තාවකාලික ලිපිනය :- | 09. දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| 10. විවාහක අවිවාහක බව :- | 11. කලත්‍රයාගේ නම :- | 12. කලත්‍රයාගේ රැකියාවක් කරන්නේ නම් රැකියාව හා සේවා ස්ථානය :- | |
| 13. දරුවන් ගණන :- | 14. ඔවුන්ගේ වයස :- | 15. ඉගෙනුම ලබන පාසල :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| 16. මුල්පත්වීම් දිනය :- | 17. සේවයෙහි ස්ථිර කර තිබේද? |
| 18. වර්තමාන සේවා ස්ථානය :-<br>අමාත්‍යාංශය -<br>දෙපාර්තමේන්තුව -<br>සේවය කරන ආයතනය - | 19. සේවා ස්ථානය පිහිටි නගරය :- |
| 20. වර්තමාන සේවා ස්ථානයට වාර්තා කිරීම<br>i. නවක නිලධරයෙකු නම් සේවා ස්ථානයට වාර්තා කල දිනය :- ...........................<br>ii. ස්ථාන මාරු පැමිණි නිලධරයෙකු නම් ස්ථාන මාරු ක්‍රියාත්මක වර්ෂයේ, ස්ථාන මාරු ක්‍රියාත්මක වූ දිනය :- .......................... | 21. 2025.12.31 දිනට වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :-<br>අවු............. මාස............. දින.......... |

ඈ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු

| කැමැත්තේ අනුපිළිවෙළ අනුව අංකය | ස්ථාන මාරු ඉල්ලුම් කරන නගර (සේවා ස්ථාන සඳහන් නොකරන්න) |
|---|---|
| **01** | |
| **02** | |
| **03** | |
| **04** | |
| **05** | |

මෙහි දී දුෂ්කර සේවා ස්ථානයක සේවය කරන නිලධරයන් / සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

ඇ.පූර්ව සේවා ස්ථාන තොරතුරු (මෙම තීරු ප්‍රමාණවත් නොවේ නම් වෙනම කොළයක ලියා අමුණන්න)

| පූර්ව සේවා ස්ථාන | සේවා කාලය | |
|---|---|---|
| | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

ඉ. නිලධරයාගේ ප්‍රකාශය

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. මාගේ පත්වීම් ලිපියේ දක්වා ඇති කොන්දේසි පරිදි මා වෙත ලබා දෙන ස්ථාන මාරුව අනුව වර්තමාන සේවා ස්ථානයෙන් ස්ථාන මාරු වීමට එකඟ වෙමි.

දිනය :-.............................................. ................................................

අත්සන

ඊ. ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

ඉහත නම සඳහන් නිලධරයාගේ 16 – 21 දක්වා තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, මෙම අය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුර දරන්නාට පෞද්ගලික වන සේ (Personal to the Holder) අනුමත කර ඇති තනතුරක් හෝ දෙපාර්තමේන්තුගත තනතුරක් දරණ අයෙකු නොවන බවත් ප්‍රකාශ කරන අතර, ස්ථාන මාරු නියෝගය අනුව ලබා දෙන ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමටත් එකඟ වෙමි.

..................................................
ආයතන ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :- ....................................

....................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා
(නිල මුද්‍රාව)

දිනය :- ........................................

**සැලකිය යුතුයි :-**

ඉහත ඉල්ලුම්පත්‍රයේ සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කල යුතුය. එසේ සම්පූර්ණ නොකිරීම මත වන අගතිය අදාල නිලධාරියා විසින් දැරිය යුතුය.

(වා.ස්.මා.අංක 03
ආකෘතිය)

# උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ ඒකාබද්ධ සේවාවන්හි
# වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත-2026
## (වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර නොමැති නිලධරයන් / සේවකයින් සඳහා)

| | | | | |
|---|---|---|---|---|
| සේවය:- | තනතුර:- | | ශ්‍රේණිය:- | |
| අධීක්ෂණ තනතුරක් දරන්නේද? | දරනු ලබන අධීක්ෂණ නිලධාරී තනතුර:- | | | |

අ. පෞද්ගලික තොරතුරු

| | | | |
|---|---|---|---|
| **01.** සම්පූර්ණ නම :- | | | |
| **02.** මුලකුරු සමඟ නම :- | | | |
| **03.** උපන් දිනය :- | **04.** වයස (2025.12.31 දිනට) අවු...........මාස.........දින....... | **05.** ජාතික හැඳුනුම්පත් අංකය :- | **06.** ස්ත්‍රී /පුරුෂ භාවය |
| **07.** ස්ථිර ලිපිනය :- | **08.** තාවකාලික ලිපිනය :- | **09.** දුරකථන අංකය :-<br>කාර්යාලය :-<br>පෞද්ගලික :- | |
| **10.** විවාහක අවිවාහක බව :- | **11.** කලත්‍රයාගේ නම :- | **12.** කලත්‍රයා රැකියාවක් කරන්නේ නම් රැකියාව හා සේවා ස්ථානය :- | |
| **13.** දරුවන් ගණන :- | **14.** ඔවුන්ගේ වයස :- | **15.** ඉගෙනුම ලබන පාසල :- | |

ආ. සේවා තොරතුරු

| | |
|---|---|
| **16.** මුල්පත්වීම් දිනය :- | **17.** සේවයෙහි ස්ථිර කර තිබේද? |
| **18.** වර්තමාන සේවා ස්ථානය :-<br>අමාත්‍යාංශය -<br>දෙපාර්තමේන්තුව -<br>සේවය කරන ආයතනය - | **19.** සේවා ස්ථානය පිහිටි ආසන්න ප්‍රධාන නගරය :- |
| **20.** වර්තමාන සේවා ස්ථානයට වාර්තා කිරීම<br>**i.** නවක නිලධරයෙකු නම් සේවා ස්ථානයට වාර්තා කල දිනය :- ...........................<br>**ii.** ස්ථාන මාරු පැමිණි නිලධරයෙකු නම් ස්ථාන මාරු ක්‍රියාත්මක වර්ෂයේ ස්ථාන මාරු ක්‍රියාත්මක වූ දිනය :- ........................... | **21.2025.12.31** දිනට වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය :-<br>අවු............... මාස............ දින........... |

__ඈ. ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු__

| කැමැත්තේ අනුපිළිවෙළ අනුව අංකය | ස්ථාන මාරු ඉල්ලුම් කරන නගර (සේවා ස්ථාන සඳහන් නොකරන්න) |
|---|---|
| **01** | |
| **02** | |
| **03** | |
| **04** | |
| **05** | |

මෙහි දී දුෂ්කර සේවා ස්ථානයක සේවය කරන නිලධරයන් / සේවකයින් සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

__ඈ.පූර්ව සේවා ස්ථාන තොරතුරු (මෙම තීරු ප්‍රමාණවත් නොවේ නම් වෙනම කොළයක ලියා අමුණන්න)__

| පූර්ව සේවා ස්ථාන | සේවා කාලය | |
|---|---|---|
| | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

__ඉ. නිලධරයාගේ ප්‍රකාශය__

ඉහත තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි. මාගේ පත්වීම් ලිපියේ දක්වා ඇති කොන්දේසි පරිදි මා වෙත ලබා දෙන ස්ථාන මාරුව අනුව වර්තමාන සේවා ස්ථානයෙන් ස්ථාන මාරු වීමට එකඟ වෙමි.

දිනය :-............................................... ................................................

අත්සන

__ඊ. අමාත්‍යංශ / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය__

ඉහත නම සඳහන් නිලධරයාගේ 16 – 21 දක්වා තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, මෙම අය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුර දරන්නාට පෞද්ගලික වන සේ (Personal to the Holder) අනුමත කර ඇති තනතුරක් හෝ දෙපාර්තමේන්තුගත තනතුරක් දරණ අයෙකු නොවන බවත් ප්‍රකාශ කරන අතර, ස්ථාන මාරු නියෝගය අනුව ලබා දෙන ස්ථාන මාරුව ක්‍රියාත්මක කිරීමටත් එකඟ වෙමි.

...................................................

ආයතන ප්‍රධානියා

(නිල මුද්‍රාව)

දිනය :- .....................................

...................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියා

(නිල මුද්‍රාව)

දිනය :- ........................................

**සැලකිය යුතුයි :-**

ඉහත ඉල්ලුම්පත්‍රයේ සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කල යුතුය. එසේ සම්පූර්ණ නොකිරීම මත වන අගතිය අදාල නිලධාරියා විසින් දැරිය යුතුය.